www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජාතීන්ගේ සටන් විරාම යෝජනාව ශ්‍රී ලංකා ආන්ඩුව විසින් ප්‍රතික්ෂේප කරයි

**Sri Lankan government rejects UN ceasefire call**

**කේ රත්නායක විසිනි**

**2009 අප්‍රේල් 28**

දිවයිනේ උතුරෙහි සටන් විරාමයක් සඳහා එක්සත් ජාතීන් ගෙන ආ යෝජනාව ආන්ඩුව විසින් ප්‍රතික්ෂේප කර ඇති නමුදු නැගී එන ජාත්‍යන්තර බලපෑම් හමුවේ සුලු සහනයක් ලෙස, එල්ටීටීඊයට එරෙහිව මිලිටරිය තවදුරටත් බර අවි හෝ ගුවන් ප්‍රහාර එල්ල නොකරනු ඇතැයි එය 27 දින නිවේදනය කලේය.

ජාතික ආරක්ෂක මන්ඩලයේ රැස්වීමෙන් අනතුරුව නිකුත්කල නිවේදනයකින් කියවුනේ "සටන් මෙහෙයුම් එහි අවසානයට ලගාවී තිබෙන බව හා සිවිල් වැසියන්ට හානි සිදුවිය හැකි නවීන බර තුවක්කු, ප්‍රහාරක ගුවන් යානා හා ගුවන් අවි යොදාගැනීම නතර කිරීමට ආරක්ෂක හමුදාවන්ට උපදෙස් දී තිබෙන" බව ය. "ප්‍රාන ඇපකරුවන් ලෙස රඳවාගෙන සිටින සිවිල් වැසියන් මුදාගැනීමට" පමනක් මෙහෙයුම් සීමාකර ඇති බවය.

මෙම නිවේදනයේ කිසිදු විශ්වාසනීයත්වයක් නොමැත. සිවිල් වැසියන් "ආරක්ෂක පලිහක්" ලෙස යොදාගැනීම නිසා මරන සංඛ්‍යාව ඉහල ගොස් තිබීම පිලිබඳව මීට පෙර එල්ටීටීඊයට චෝදනා නගමින් ජනාධිපති මහින්ද රාජපක්ෂ, හමුදාවේ ආක්‍රමනික මෙහෙයුම් "ලෝකයේ ලොකුම ප්‍රාන ඇපකරුවන් මුදාගැනීම" ලෙස සරසනු ලැබීය. ඉහල ආරක්ෂක නිලධාරීන් යලි යලිත් කියා සිටියේ ආන්ඩුවේ ප්‍රකාශිත "වෙඩි නොතැබීමේ" කලාපය වෙත පහර දීමට හමුදාව බර අවි යොදා නොගත් බවය.

එහෙත් ප්‍රකාශය මගින් සිදුව ඇත්තේ 50,000 සිවිල් වැසියන් එක් රොක්ව සිටි වර්ග කිලෝමීටර් දහයක පමන වෙරල බඩ කුඩා බිම් තීරුව වෙත හමුදාව විසින් ගුවන් හා බර අවි ප්‍රහාර එල්ල කොට ඇති බව තහවුරු වීම පමනකි. එක්සත් ජාතීන්ගේ ගනන් බැලීම් අනුව පසුගිය තෙමස තුල සාමාන්‍ය වැසියන් 6,432 මියගොස් 13,946 තුවාල ලබා ඇත. පසුගිය සතිය තුල ඉවක් බවක් නැතිව එල්ල කල හමුදාවේ ප්‍රහාර හේතු කොට ගෙන තවත් සිය ගනනක් මියගොස් ඇත.

සටන් මෙහෙයුම් අත්හිටුවා ඇති බවට කල ප්‍රකාශය සම්බන්ධයෙන් සලකන කල, ආන්ඩුවේ ප්‍රකාශය සටන් විරාමයකට සමාන වන්නේය යන්න වහාම ප්‍රතික්ෂේප කල ආරක්ෂක අමාත්‍යාංශය කියා සිටියේ එවන් අර්ථ දැක්වීමක් "මුල් ප්‍රකාශය අමු අමුවේ විකෘති කිරීමක්" බවය. වෙනත් වචනවලින් කිවහොත් හමුදාව එහි සාපරාධී ක්‍රියාන්විතය තවදුරටත් ඉදිරියට ගෙන යන බවය. "සිවිල් වැසියන් මුදාගැනීමේ" වහන්තරාව යටතේ තව තවත් මිනිසුන්, ගැහැනුන් හා ලමුන් මරාදැමෙනු ඇත.

තවද, බර අවි යොදා නොගැනීමේ කාරනය නිරීක්ෂනය කල නොහැකිය. කිසිදු ස්වාධීන මාධ්‍ය කරුවෙකුට යුද කලාපය අසලකට හෝ යාමට ඉඩ නොලැබේ. මීට ප්‍රථම මිලිටරිය ආධාර ආයතනවලට උතුරෙන් ඉවත්ව යන ලෙසට නියෝග පනවා තිබුනි. වෙඩි මුක්ත කලාපය හා අවටින් කාන්දුවූ ඕනෑම වාර්තාවක් එල්ටීටීඊ ගැති ප්‍රචාර ලෙස ආන්ඩුව විසින් හෙලා දකිනු ලැබිනි.

සති අන්තයේ ශ්‍රී ලංකාව තුල සංචාරයක යෙදුනු එක්සත් ජාතීන්ගේ මානුෂික කටයුතු ප්‍රධානී ජෝන් හෝම්ස් ආන්ඩුව සටන් විරාමයක් ප්‍රතික්ෂේප කිරීම පිලිබඳව වචනයක් හෝ සඳහන් නොකලේය. 27 දින මාධ්‍ය හමුවේදී ඔහු කියා සිටියේ බර අවි යොදාගැනීම අත්හිටුවීමේ නිවේදනය "අව්‍යාජව පිලිපදිනු" ඇති බව තම විශ්වාසය බවය. ඒ සමගම ඔහු සඳහන් කලේ එජා මානුෂික ආධාර කන්ඩායමට යුද පෙරමුන කරා යාමට ඉඩ සැලසීම ආන්ඩුව විසින් ප්‍රතික්ෂේප කල බවය.

සාමාන්‍ය වැසියන්ගේ ජීවිත කෙරෙහි ආන්ඩුවේ සාපරාධී නොතැකීම, සෙනසුරාදා නිවේදනය කරන ලද එල්ටීටීඊ "ඒකපාර්ශවික සටන්විරාමයට" එය දැක්වූ ප්‍රතිචාරයෙන් පිලිබිඹු කෙරේ, ජනාධිපතිගේ සොහොයුරු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ එම ප්‍රකාශය "විහිලුවක්" ලෙස හංවඩු ගැසීය. "ඔවුන් අප සමග සටන්වැදුනේ නැත, ඔවුන් අප කෙරෙන්

පලායමින් සිටියේය. සටන් විරාමයක අවශ්‍යතාවක් ඇත්තේ නැත. ඔවුන් යටත් විය යුතුය, එපමනකි." යනුවෙන් ඔහු වැඩි දුරටත් පැවසීය.

එල්ටීටීඊය සිවිල් වැසියන් පලායාමෙන් වලක්වන බවට වාර්තා ආධාර ආයතන විසින් පලකොට තිබුනේවී නමුත්, උතුරේ මානුෂික ව්‍යසනයේ වගකීම කෙලින්ම රැඳී ඇත්තේ රාජපක්ෂ ආන්ඩුව මතය. පනස්දහසක හට පිරිස් යොදාගනිමින් හමුදාව ප්‍රදේශය අත්අඩංගුවට ගෙන ඇති අතර, වෙඩි මුක්ත කලාපයට ප්‍රමානවත් ආධාර සැපයුම් ලගාවීම අවහිර කොට තිබේ. සිවිල් වැසියන් රැඳී සිටින ප්‍රදේශවලට හමුදාව එල්ල කරන කාලතුවක්කු හා ගුවන් ප්‍රහාර ජාත්‍යන්තර නීතිය යටතේ යුද අපරාධවලට සමාන වේ.

එල්ටීටීඊ වෙතින් "මුදාගෙන" ඇති සියල්ලන්ම ආරක්ෂක හමුදාවන් විසින් රැකවල් ලා ඇති රැඳවුම් කඳවුරු තුලට ගාල් කිරීමේ කාරනයෙන්, දෙමල වැසියන් කෙරෙහි ආන්ඩුවේ එදිරිවාදීකම ඉස්මතු කෙරෙයි. ආන්ඩුවේ ගනන් හිලව්වලට අනුව වව්නියාව, යාපනය හා ත්‍රිකුනාමලය යන නගර අවට ස්ථාන 38 පුද්ගලයන් 150,000 ක් රඳවා තබා ඇත. ආධාර ආයතන සඳහන් කරන්නේ සංඛ්‍යාව 200,000 තරම්වන බවත් තවත් දස දහස් ගනනක් මඟ එමින් සිටින බවත් ය.

27 දින නිකුත් කල එජා ආයතනයේ මාධ්‍ය ප්‍රකාශයකට අනුව "කඳවුරුවල ප්‍රධාන ගැටලුව බවට පත් වෙමින් ඇත්තේ ඉඩ කඩ ප්‍රශ්නයයි." වව්නියාව අසල මැනික් ෆාම් නමැති එක් ස්ථානයක පුද්ගලයන් අටත් දහයත් අතර ගනනක් සාමාන්‍යයෙන් හතරක් හෝ පහකට සැලසුම් කල නවාතැනක රැඳී සිටිති. කඳවුරු තුල රැඳී සිටින අභ්‍යන්තරව අවතැන්වූ බොහෝ පුද්ගලයන්ට දැඩි හිරු රැසට හෙවනක් නැත."

එජා මානව සුරකුම් සංවිධානය මන්නාරම, ත්‍රිකුනාමලය, යාපනය හා වව්නියාව යන ප්‍රදේශවල රැඳවියන් සඳහා තවත් පොදු ගොඩනැගිලි හා ඉඩම් ඉල්ලා ඇත. ත්‍රිකුනාමලයේ අක්කර 100 ඉඩමක් පුද්ගලයන් 20,000ක් නැතහොත් පවුල් 5,000 සඳහා හෙලි පෙහෙලි කොට තිබේ. උග්‍ර මන්ද පෝෂනයෙන් පෙලෙන හා දින ගනන් නිරාහාරව සිට ඇති බොහෝ අවතැන් වූවන් ගැන ආධාර සේවකයන් පැමිනිලි කර ඇත. රෝගී වූවන් හා තුවාලකරුවන් ප්‍රවාහනය සඳහා ප්‍රමානවත් පහසුකම් නොමැතිකම මෙන්ම සෞඛ්‍ය සේවකයන්ගේ බරපතල හිඟයක් ද පවතියි.

මෙඩිසින් සැන්ස් ෆ්‍රන්ටියර්ස් සංවිධානයේ ශල්‍ය වෛද්‍යවරයෙකු වන පෝල් මැක් මාස්ටර් අප්‍රේල් 27 සඳහන් කලේ "සියලුම රෝහල් තුවාලකරුවන්ට ප්‍රතිකාර කිරීමේ අරගලයක නිරතව සිටියි" යනුවෙනි. දින පහක් තුල ශල්‍යකර්ම 100 වඩා පහත වැටුනු ප්‍රථම අවස්ථාව සටහන් කරමින් වව්නියාව රෝහලේ අප්‍රේල් 23 සිදුකල හදිසි සැත්කම් සංඛ්‍යාව 44 ක් පමනක් විය. 24 වන දින එය 18 තෙක් පහත වැටුනි. මිලිටරිය හදිසි රෝගීන් අනෙකුත් රෝහල් කරා හරවා යවනු ලැබිනි.

"කැඩුම් බිඳුම්, මුනිස්සම් වැදුනු හා පිපිරීම් තුවාල සහිත රෝගීන් වාට්ටු, ආලින්ද තුල හා බිම තවමත් වැතිර සිටියි. බොහෝ පුද්ගලයන් සමහර විට ශල්‍යාගාර වෙත යවන තෙක් පැය 24 ම වාට්ටුවල බලා සිටියි." යනුවෙන් මැක් මාස්ටර් පැවසීය. ඔහු ඇඳන් 350 යුත් මන්නාරම් රෝහලට පැමිනි කල රෝගීන් දහසක් දැකගත් අතර සමහරෙක් සිටියේ රෝහලෙන් පිටත කූඩාරම් තුලය.

මැක් මාස්ටර් මෙසේ ද පැවසීය. "අපි අද දින වව්නියවේ සිට කිමී 40 දුරින් පිහිටි මැනික් ෆාම් වෙත ද ගමන් ගත්තෙමු. එහි දැනට අවතැන්වූ පුද්ගලයන් 100,000 සිටියි. වැඩි ඉඩ කඩ සඳහා තවත් ඉඩම් බුල්ඩෝසර් යොදා හෙලි පෙහෙලි කෙරෙන අතර යුනිසෙෆ් සංවිධානය සිය ගනනින් කූඩාරම් ඉදිකරයි. දින කිහිපයකට පෙර උතුරේ සිට මැනික් ෆාම් වෙත පැමින සිටි එක් පුද්ගලයෙක් අප වෙත පැමින මෙසේ හඬ නැගීය. ෂෙල් වෙඩි හඬින් කම්පනයට පත්ව සිටින මොහු, මම ඉඳලා වැඩක් නෑ, මම ඉඳලා වැඩක් නෑ යනුවෙන් ඔහේ හඬ නගයි."

ශ්‍රී ලංකාවේ මානුෂික අර්බුදය පිලිබඳව එජා හා විවිධ මහා බලවතුන් විසින් නිකුත් කරන ප්‍රකාශන වල හිඟයක් නැත. එක්සත් ජනපදය මානුෂික සටන් විරාමයක් පිලිබඳ යෝජනාවට පිටුබලය දුන්නේය. බ්‍රිතාන්‍ය විදේශ ලේකම් ඩේවිඩ් මිලිබෑන්ඩ් ද ඔහුගේ ප්‍රන්ස හා ස්වීඩන් සහකරුවන් ද යුද්ධය හා මිනිසුන්ගේ තත්වය ගැන කථාබස් කිරීමට අද දිනයේ කොලඹට පැමිනීමට නියමිතව ඇත.

මිලිබෑන්ඩ් "සටන් මෙහෙයුම් අත්හිටුවීම" පිලිබඳ ආන්ඩුවේ නරුම ප්‍රකාශය ගැන ඊයේ සතුට පල කලේය. "සැබවින්ම සිවිල් ජනතාව මිය යාමේ පරිමාව ඉතා විශාලය. එය ජාත්‍යන්තර ප්‍රජාව බෙහෙවින් කනස්සල්ලට පත්කර තිබෙන අතර එය කුමන හෝ දිගුකාලීන විසඳුමක් සඳහා මුලුමනින්ම අවැඩදායකය." ඔහු එසේ ප්‍රකාශ කලේය.

2002 සටන් විරාමය තුලින් ක්‍රියාවට නැගුනු " සාම ක්‍රියාවලිය" නිරීක්ෂනය කිරීමේ වගකීම දරන ලද එක්සත් ජනපදය, යුරෝපීය සංගමය හා ජපානය යන ඊනියා සම සභාපතිවරුන්ගේ රැස්වීමෙන් පසුව 26 ඉරිදා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව ප්‍රකාශයක් නිකුත් කලේය. ශ්‍රී ලංකා ආන්ඩුව සිය හමුදා පූර්ව සටන් විරාම සීමාවන් කරා යලි ගෙනආයුතු බව කියා සිටීම කෙසේ වෙතත් ප්‍රකාශය, සිවිල් ජනතාව වෙඩි මුක්ත කලාපයෙන් ඉවත්වීම වලක්වන බවට එල්ටීටීඊය හෙලාදුටු අතර "ඔවුන් සිය ආයුධ මධ්‍යස්ථ

පාර්ශවයක් වෙත බාරදිය යුතු" බව කියා සිටියේය. ආන්ඩුව දෙමල කොටි සටන්කරුවන් බොහෝ දෙනෙකුට සමාව ලබාදී දේශපාලන සංවාදයකට මඟ විවෘත කල යුතු බව ප්‍රකාශයෙන් කියා තිබුනි.

කෙසේ වුව ද මෙම ආන්ඩු කිසිවක්, 2006 ජූලි මාසයේ සිවිල් යුද්ධය යලි ඇරඹීම හා ආක්‍රමනයෙන් සිවිල් ජනතාව මත ඇතිවිය හැකි බලපෑම ගැන කිසිදු තැකීමක් නොකල ශ්‍රී ලංකා ආන්ඩුව හෙලාදැකීමට ඉදිරිපත් නොවීය. තෙවසරක් පමනවූ කාලයක් තිස්සේ "ජාත්‍යන්තර ප්‍රජාව" රාජපක්ෂගේ වාර්ගික යුද්ධයට නොමඳව සහාය දුන් අතර හමුදාවේ නොපනත්කම් හා ආන්ඩුව අමූ අමුවේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් උල්ලංඝනය කිරීම් නොදැක්කා සේ සිටියහ. 2002 සටන් විරාමය ආන්ඩුව විසින් 2008 ජනවාරියෙහි නිල වශයෙන්ම කටුගා දැමූ අවස්ථාවේ සම සභාපතිවරු ඊට එරෙහිව හීන් හඬක් පවා නොනැගූහ.

අලුත්ම ප්‍රකාශය උතුරේ දෙමල ජනතාවගේ දුක් පීඩාවන් කෙරෙහි හටගත් කනස්සල්ලක් සමඟ ගෑවිලාවත් ඇත්තේ නැත. ඊට පටහැනි ලෙස " ජාත්‍යන්තර ප්‍රජාවේ" කනස්සල්ල පලව ඇත්තේ රටේ දෙමල ප්‍රභූ පැලැන්තියට අඩුම තරමින් යම් සහන පිරිනැමෙන, යුද්ධය සඳහා දේශපාලන විසඳුමකින් තොරව වාර්ගික ආතතීන් හා දේශපාලන අස්ථාවරත්වය දිගටම පවතිනු ඇතැයි යන්න කෙරෙහිය. විශේෂිතව ම එක්සත් ජනපදය උත්සුකවී ඇත්තේ කලාපය තුල සිය ආර්ථික හා මූලෝපායික සහකරුවා බවට පත්ව සිටින අසල්වැසි ඉන්දියාව කෙරෙහි යුද්ධය නිසා ඇතිව තිබෙන බලපෑමෙන් නිර්නිත බිඳෙන සුලු තත්වය පිලිබඳව ය. ඒ සමඟම, ඉතිරිව ඇති එල්ටීටීඊ ප්‍රතිරෝධය හමුදාව විසින් බිඳහෙලීමත් සමඟ රට තුල විවර වන කුමන හෝ අවස්ථාවන් ඩැහැ ගැනීම සඳහා සියලුම මහා බලවත්තු හරි බරි ගැසෙමින් සිටිති.

© www.wsws.org